සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
*All Rights Reserved*

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

## 11 - ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - I

නම / විභාග අංකය : .................................................................................. කාලය පැය 01 යි

**දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා අංකය හිස්තැනෙහි ලියන්න.**

---

01. රාජ්‍යයක උත්තරීතර නීතිය ලෙස සළකන්නේ (.................................)
    1. දේශීය නීතියයි.
    2. ජාත්‍යන්තර නීතියයි.
    3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.
    4. අපරාධ නීතියයි.

02. යාපනය පළාතේ වාසය කරන මලබාර්වරුන්ගේ සිරිත් විරිත් හෙවත් තේසවලාමෙයි 1706 අංක 18 දරණ රෙගුලාසිය මඟින් නීතියක් බවට පිළිගනු ලැබුවේ පහත සඳහන් කුමන ආණ්ඩුකාරවරයාගේ උපදෙස් පරිදිද? (.................................)
    1. රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා
    2. මේසන් මුවර් ආණ්ඩුකාරවරයා
    3. වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා
    4. සයිමන්ස් ආණ්ඩුකාරවරයා

03. සියලු විනිශ්චය අධිකාර හා ආයතනවල අභියාචනා පිළිබඳ බලය හිමි අධිකරණය වන්නේ (.......................)
    1. මහාධිකරණයයි.
    2. අභියාචනාධිකරණයයි.
    3. ශ්‍රේෂ්ඨාධිකරණයයි.
    4. මහේස්ත්‍රාත් අධිකරණයයි.

04. රජය සම්බන්ධ නඩු වලදී නීති උපදෙස් ලබා දෙන්නේ (.................................)
    1. නීතිපතිතුමා විසිනි.
    2. අග්‍රවිනිශ්චයකාරතුමා විසිනි.
    3. ජනාධිපතිතුමා විසිනි.
    4. ඔම්බුඩ්ස්මන් විසිනි.

05. ජෛව සම්පත් වල ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව සිදුවන විනාශය හඳුන්වන්නේ (..........................)
    1. පරිසර දූෂණය නමිනි.
    2. ජෛව සම්පත් හායනය නමිනි.
    3. ජල දූෂණය නමිනි.
    4. ගොඩබිම් දූෂණය නමිනි.

06. ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කරන ලද්දේ (.................................)

| | |
|---|---|
| 1. 1993 දීය. | 2. 1981 දීය. |
| 3. 1979 දීය. | 4. 1999 දීය. |

07. සර්ව සාධාරණ ලියවිල්ලක් ලෙස සැලකෙන එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ඇති වගන්ති ගණන (...........................)
1. 25 කි. 2. 24 කි.
3. 30 කි. 4. 20 කි.

08. මෙරට පාර්ලිමේන්තුව සඳහා මහජන ඡන්දයෙන් පත්කර ගන්නා මන්ත්‍රීන් සංඛ්‍යාව (.........................)
1. 26 කි. 2. 225 කි.
3. 196 කි. 4. 29 කි.

● සංවර්ධිත රටවල් මුහුණ පාන ගැටලු කිහිපයක් හා සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණපාන ගැටලු කිහිපයක් පහත A , B, C, D, E, F වලින් දක්වා ඇත. ඒවා හොඳින් අධ්‍යයනය කර අංක 9 සහ 10 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ජාත්‍යන්තර ත්‍රස්තවාදය
B ප්‍රාග්ධන හිඟය
C විරැකියාව
D අමුද්‍රව්‍ය ලබාගැනීමේ අපහසුව
E දේශපාලන අස්ථාවර බව
F වෙළඳපොළ සඳහා ඇති තරඟය

09. සංවර්ධිත රටවල් පමණක් මුහුණපාන ගැටළු දැක්වෙන කාණ්ඩය කුමක්ද? (.................................)
1. ABC 2. CDE 3. ADF 4. BCD

10. සංවර්ධනය වෙමින් පවතින රටවල් පමණක් මුහුණපාන ගැටලු දැක්වෙන කාණ්ඩය කුමක්ද? (.......................)
1. BCE 2. ABC 3. CDF 4. ADE

● අංක 11 සිට 20 තෙක් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ නිවැරදි නම් (නි) අක්ෂරයද වැරදි නම් (වැ) අක්ෂරයද වරහන තුළ ලියන්න.

11. ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ව්‍යවස්ථාවයි. ( )

12. ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය ලබාදුන්නේ සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි. ( )

13. සිංහල රජදවස මහ නඩුව යනු ඉහළ උසාවියකි. ( )

14. ශ්‍රී ලංකාවේ ප්‍රථම නීතිපතිවරයා ශ්‍රීමත් ඔලිවර් ගුණතිලකය. ( )

15. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන වගන්තියේ සඳහන් වන්නේ මූලික යුතුකම් පිළිබඳවය. ( )

16. අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම යහපාලනයේ එක් ගුණාංගයකි. ( )

17. 1917 දී රුසියන් විප්ලවය සිදුවිය. ( )

18. යහපත් ජීවන තත්වයක් වර්ධනය කරගැනීමේ අයිතිය දේශපාලන අයිතිවාසිකමකි. ( )

19. එක් මධ්‍යම බල අධිකාරියක් තුළ බලය ඒකරාශි වීම සන්ධීය ආණ්ඩුවක ලක්ෂණයකි. ( )

20. විධායක ජනාධිපතිවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සතු වරප්‍රසාද වලට හිමිකම් ලබයි. ( )

- අංක 21 සිට 30 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ අතුරෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පුද්ගල නීති වන්නේ
    1. උඩරට නීතිය
    2. අපරාධ නීතිය
    3. තේසවලාමෙයි නීතිය
    4. මුස්ලිම් නීතිය (..............................)

22. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වන්නේ
    1. පළාත් සභා
    2. ප්‍රාදේශීය සභා
    3. නගර සභා
    4. මහ නගර සභා (..............................)

23. භෞතික ජීවන තත්ව දර්ශකයේ සංරචක වන්නේ
    1. සාක්ෂරතාව
    2. දළ ජාතික නිෂ්පාදිතය
    3. ළදරු මරණ අනුපාතිකය
    4. උපතේදී අපේක්ෂිත ආයු කාලය (..............................)

24. ලන්දේසි යුගයේදී යුක්තිය ඉටුකර දීම සඳහා හඳුන්වා දුන් උසාවි වර්ග වන්නේ
    1. ගම්බද උසාවි
    2. මහාධිකරණය
    3. දිස්ත්‍රික් උසාවි
    4. නාගරික උසාවි (..............................)

25. අධිකරණ කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු බලතල වන්නේ
    1. අගවිනිසුරු පත්කිරීම.
    2. අධිකරණ ඇමති පත්කිරීම.
    3. වරද කරුවන්ට සමාව දීම.
    4. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම. (..............................)

26. ශ්‍රී ලංකාවට ඉංග්‍රීසින් විසින් හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වන්නේ
    1. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
    2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
    3. 1947 සොල්බරි ප්‍රතිසංස්කරණ
    4. 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ (..............................)

27. මහජනතාව විසින් පළාත් පාලන ආයතන සම්බන්ධව ඉටුකළ යුතු යුතුකම් වන්නේ
    1. සුබසාධක කටයුතු පවත්වාගෙන යාම.
    2. නිසි පරිදි බදු මුදල් ගෙවීම.
    3. පොදු දේපළ ආරක්‍ෂා කිරීම.
    4. පොදු සේවා අයථා ලෙස පරිහරණය නොකිරීම. (..............................)

28. ගැටුම් නිරාකරණය කරගත හැකි ක්‍රම නම්
    1. මැදිහත්කරණය
    2. වාණිජකරණය
    3. සමථකරණය
    4. සහමන්ත්‍රණය (..............................)

29. සාගර ආශ්‍රිත ජල දූෂණ ප්‍රභව වන්නේ
   1. ඛනිජ තෙල් සාගරයට එකතු වීම.
   2. ප්ලාස්ටික් හා ඝන අපද්‍රව්‍ය මුහුදට එකතු කිරීම.
   3. ගිනිකඳු පිපිරීම.
   4. න්‍යෂ්ටික අත්හදා බැලීම. (.......................)

30. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතන වන්නේ
   1. ලෝක සෞඛ්‍ය සංවිධානය
   2. ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානය
   3. පොදු රාජ්‍ය මණ්ඩලය
   4. අන්තර් ජාතික මූල්‍ය අරමුදල (.......................)

- සුදුසු වචන යොදා පහත සඳහන් වගන්ති සම්පූර්ණ කරන්න.

31. "ආශාවන්ගෙන් බලපෑම් නොලත් තාර්කික බුද්ධිය නීතියයි." මෙම නිර්වචනය ඉදිරිපත් කළේ ....................................... ය.

32. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් වරයා පත් කරන්නේ, ....................................................... අනුමැතිය සහිතව ජනාධිපතිවරයා විසිනි.

33. ශ්‍රී ලංකාවේ සෑම පළාත් සභාවකම නාමික විධායකයා වන්නේ ............................................... ය.

34. ජාත්‍යන්තර ආරක්‍ෂාවට තර්ජනයක් විය හැකියයි අදහස් කරන ඕනෑම කාරණයක් ආරක්‍ෂක මණ්ඩලය වෙත යොමු කිරීමේ බලය ඇත්තේ ............................................... ට ය.

35. දකුණු ආසියා කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) නිර්මාතෘවරයා නම් ....................................................... ය.

- අංක 36 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවල අදාළ වර්ෂය නිවැරදිව ගලපා අදාළ අක්ෂරය හිස් තැනෙහි ලියන්න.

| | | |
|---|---|---|
| 36. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත කිරීම. | (    ) | A. 1985-12-08 |
| 37. සාර්ක් ප්‍රඥප්තිය අත්සන් කිරීම. | (    ) | B. 1945-10-24 |
| 38. සීඩෝ සම්මුතිය සම්මත කිරීම. | (    ) | C. 1986-12-03 |
| 39. එක්සත් ජාතීන්ගේ සංවිධානය නිල වශයෙන් ආරම්භ කිරීම. | (    ) | D. 1948-12-10 |
| 40. ජාත්‍යන්තර දරුකමට හදාගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනා සම්මුතිය. | (    ) | E. 1979-12-18 |
| | | F. 1945-04-05 |

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - II

නම / විභාග අංකය : ................................................................................ කාලය පැය 02 යි

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. i. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගින් ලාංකිකයන්ට දේශපාලන කටයුතු වලට මැදිහත්වීමට ඉඩලබා දුන් අවස්ථා දෙකක් සඳහන් කරන්න.
   ii. ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාසයක් ලෙස ගෙන ඡන්දය විමසීම් කෙරෙන අවස්ථා දෙක නම් කරන්න.
   iii. සංවර්ධනය මනින නූතන මිනුමක් වන මානව සංවර්ධන දර්ශකය (H.D.I) සකස් කිරීමට අවශ්‍ය නිර්නායක දෙකක් සඳහන් කරන්න.
   iv. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අපනයන සැකසුම් කලාප දෙකක් නම් කරන්න.
   v. මුලතිව් දිස්ත්‍රික්කය හා හම්බන්තොට දිස්ත්‍රික්කය අයත්වන පළාත් දෙක අනුපිළිවෙලින් දක්වන්න.
   vi. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාවගේ මූලික යුතුකම් දෙකක් ලියන්න.
   vii. ජාතික රාජ්‍යයන් ලෙස ප්‍රථමයෙන් සංවිධානය වූ රටවල් දෙක නම් කරන්න.
   viii. සාර්ක් සාමාජික රටවල පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය පවතින රටවල් දෙකක් නම් කරන්න.
   ix. මෙරට දේශීය නීතිය පෝෂණය වී ඇති නීති වර්ග දෙක දක්වන්න.
   x. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන අංග දෙක සඳහන් කරන්න.
   (ල. 2 x 10 = 20)

2. "රාජ්‍යයේ කැමැත්ත ක්‍රියාවට නැංවෙන්නේ ආණ්ඩුව විසිනි"
   i. ආණ්ඩුවක ප්‍රධාන අංග දෙකක් නම් කරන්න. (ල. 2)
   ii. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 3)
   iii. "ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකව පවතින්නේ ජනාධිපති ආණ්ඩු ක්‍රමයකි." මේ පිළිබඳව ඔබේ අදහස කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 5)

3. "ශ්‍රී ලංකාව ද බහු සංස්කෘතික සමාජයකි."
   i. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. (ල. 2)
   ii. බහු සංස්කෘතික සමාජයක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න. (ල. 3)
   iii. බහු සංස්කෘතික සමෝධානය,
      a. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලබාගැනීමට බලපෑ ආකාරය
      සහ
      b. ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජ සංවර්ධනය කෙරෙහි බලපෑ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

4. "සම්පත් හිඟකම නිසා මූලික ආර්ථික ප්‍රශ්න බිහිවෙයි."

i. ඕනෑම රටක් මුහුණදෙන මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න. (ල. 2)

ii. ධනවාදී හා සමාජවාදී ආර්ථික රටාවන් දෙක එකිනෙකින් වෙනස්වන ආකාරය අංශ තුනකින් පෙන්වන්න. (ල. 3)

iii. ගෝලීයකරණය ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බලපෑ හැකි ආකාරය පිළිබඳව ඔබේ අදහස් පැහැදිලි කරන්න. (ල. 5)

5. "රටක නීතිය මගින් එරට පුරවැසි චර්යාව පාලනය කළ හැකිය."

i. අපරාධ නීතියට අනුව දඬුවම් පැමිණවිය හැකි වැරදි දෙකක් ලියන්න. (ල. 2)

ii. නීති නිර්මාණය වීම කෙරෙහි බලපාන මූලාශ්‍ර තුනක් දක්වන්න. (ල. 3)

iii. අග්‍ර විනිශ්චයකාරවරයාගේ කාර්යයන් දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 5)

6. පුරවැසි අවශ්‍යතා උපරිම අයුරින් ඉටුකිරීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක ප්‍රධානතම වගකීමකි."

i. ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුවේ විධායකය සමන්විත වන්නේ කුමන අංශ වලින්ද? (ල. 2)

ii. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති පොදු කාර්යයන් අතරින් සෞඛ්‍ය අංශයට පැවරී ඇති කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. ප්‍රාදේශීය ඒකක වලට බලය බෙදාහැරීමේදී මතුවිය හැකි ගැටළු දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 5)

7. "මානව අයිතිවාසිකම් දිනාගැනීමේ ක්‍රියාවලිය, කෙටිකාලීනව සිදු වූවක් නොවේ."

i. මානව අයිතිවාසිකම් දිනා ගැනීම පිළිබඳ ඉතිහාසයේ වැදගත් වූ අවස්ථා දෙකක්, අදාළ වර්ෂ ද සමඟ සඳහන් කරන්න. (ල. 2)

ii. මානව හිමිකම්, පුළුල් වශයෙන් වර්ග කර දක්වන කොටස් පහෙන් තුනක් ලියන්න. (ල. 3)

iii. අධ්‍යාපනය පිළිබඳව අයිතිවාසිකම් ලබාදීමේදී ශ්‍රී ලංකාව බොහෝ ඉදිරියෙන් සිටින රටක් බව අංග දෙකක් මගින් පෙන්නුම් කරන්න. (ල. 5)